**සමිඳාණන්ගේ ස්වර්ගාරෝහණ මංගලෝත්සවය** | **දේව ප්‍රකාශන** | 08-05-16

## පළමුවන දේව ප්‍රකාශනය

ක්‍රියා 1:1-11

අපෝසතුළුවරුන්ගේ ක්‍රියා පොතෙන් උපුටා ගත් කොටසකි.

**ඔවුන් බලා සිටියදීම ස්වාමින් වහන්සේ ස්වර්ගයට නැගුණු සේක.**

තියෝපිලස් තුමෙනි, ජේසුස් වහන්සේ කළාවූද ඉගැන්නුවාවූද සියලු දේ, මුලසිටම උන්වහන්සේ තෝරාගත් අපෝස්තුළුවරුන්ට ශුද්ධාත්මයාණන් කරණකොටගෙන අණ දී උන්වහන්සේ ස්වර්ගයට ඔසවා ගනු ලැබූ දවස දක්වා මාගේ ප්‍රථම කෘතියෙහි මම විස්තර කළෙමි. උන්වහන්සේගේ මරණයෙන් පසු සතළිස් දවසක් අතරතුර ඔවුනට දර්ශනය වෙමින් ද දෙවියන් වහන්සේගේ රාජ්‍යය ගැන දේශනාකරමින් ද බොහෝ නිසැක සාක්ෂිවලින් උන්වහන්සේ ජීවමානව ප්‍රකාශ වූ සේක. උන්වහන්සේ ඔවුන් සමග ආහාර වළඳමින් සිටියදී ඔවුන් අමතා, "ඔබ ජෙරුසලමෙන් ඉවත්ව නොගොස්, මා වදාළ පරිදි පියාණන් වහන්සේගේ පොරොන්දුව බලාපොරොත්තුවෙන් සිටින්න. මන්ද. ජොහාන් වතුරෙන් බෞතීස්ම ස්නාපනය කළේය. එහෙත් මින් නොබෝ දවසකින් ඔබ ශුද්ධාත්මයාණන්ගෙන් බෞතීස්ම ස්නාපනය කරනු ලබන්නහු ය."යි වදාළ සේක. අපෝස්තුළුවරුන් එක්රුස්වූ කළ, "ස්වාමිනි, ඔබ යළිත් ඊශ්‍රායෙල් රාජ්‍ය පිහිටුවන කාලය මෙය ද?"යි ඔවුහු උන්වහන්සේ ගෙන් ඇසූහ. උන්වහන්සේ පිළිතුරු දෙමින්, "පියාණන් වහන්සේ ස්වකීය ආධිපත්‍යයෙන් නියම කළ කාලයන් ද, අවස්ථාවන් ද දැනගැනීම ඔබට අයිති කාරියක් නොවේ. එහෙත් ශුද්ධාත්මයාණන් වහන්සේ ඔබ කෙරෙහි පැමිණි කළ ඔබ බලය ලබන්නහුය. එවිට ඔබ ජෙරුසලමෙහිද, මුළු ජුදයෙහි හා සමාරියෙහි ද, පොළොවේ සීමාන්තයන් දක්වා ද, මාගේ සාක්ෂිකාරයෝ වන්නහුය."යි වදාළ සේක. උන්වහන්සේ මෙසේ වදාරා ඔවුන් බලාසිටියදී ම ඔසවාගනු ලැබ, වලාකුළකින් වැසී ඔවුනට නොපෙනී ගිය සේක. උන්වහන්සේ යන කළ, ඔවුන් අහස දෙස බලාගෙන සිටියදී, සුදු වතින් සැරසුණු මනුෂ්‍යයෝ දෙදෙනෙක් ඔවුන් ළඟ සිට, "ගලීලයේ වැසියෙනී, ඔබ අහස දෙස බලාගෙන සිටින්නේ කුමටද? ඔබ කෙරෙන් ඔසවා ගනු ලැබූ මෙම ජේසුස් වහන්සේ ස්වර්ගයට නගිනු දුටු සේම ආපසු වඩිනු ඇත."යි කීහ.

දේව වචනය මෙසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## පිළිතුරු ගීය

ගීතාවලිය 47:1-2, 5-8

පිළිතුර: දෙවිතුමන් හට පැසසුම් ගී ගයන්න.

ගීය: සව් සතුනි, අත් පොළසන් දෙන්න. ජය ඝෝෂා නංවා දෙවිඳුන්ට තුති දෙන්න. අති උතුම් සමිඳාණෝ බියකරු ය. මුළු මහ පොළොව කෙරේ අග රජය.

ජය ගොස නංවා, කාහල හඬ පතුරා එතුමාණෝ සිහසුන මත නැගුණ සේක. දෙවිතුමන් හට ගී පසස් නගන්න. ගී පසස් නගන්න. අපේ නිරිඳු හට ගී පසස් නගන්න.

දෙවිඳාණෝ මුළු දෙරණට නිරිඳාණෝ ය. එතුමන් හට ගී පැසසුම් ගයන්න. දෙවිඳාණෝ ජාතීන් අතර රජිඳාණෝ ය. එතුමාණෝ සුවිශුද්ධ සිහසුන් අරා වැඩ සිටින සේක.

## දෙවන දේව ප්‍රකාශනය

හෙබ්‍රෙව් 9:24-28, 10:19-23

හෙබ්‍රෙව්වරුනට ලියන ලද හසුනෙන් කොටසකි.

**"දෙවියන් වහන්සේ අබිමුවෙහි පෙනී සිටින පිණිස ක්‍රිස්තුන් වහන්සේ ස්වර්ගයට ම ඇතුළු වූ සේක."**

ක්‍රිස්තුන් වහන්සේ අප උදෙසා දෙවියන් වහන්සේ අබිමුවෙහි දැන් පෙනී සිටින පිණිස, නියම ශුද්ධස්ථානයේ ආදර්ශය ලෙස අතින් සැදූ ශුද්ධස්ථානයකට නොව,

ස්වර්ගයට ම ඇතුළු වූ සේක. නායක පූජකයා අනුන්ගේ ලේ රැගෙන අවුරුදුපතා ශුද්ධස්ථානයට, ඇතුළු වන්නාක් මෙන්, උන් වහන්සේ නැවත නැවතත් තමන් ම ඔප්පු කරන පිණිස ඇතුළු නො වූ සේක. එසේ නොවූයේ නම්, ලෝකය මැවීමේ පටන් නොයෙක් වර, උන් වහන්සේට වද වේදනා විඳීම අවශ්‍ය වනු ඇත. එහෙත් උන් වහන්සේ තමන් ම පූජා කිරීමෙන් පාපය දුරු කරන පිණිස මේ යුගාන්තයේ දී සදහට ම එක වරක් ප්‍රකාශ වූ සේක. තවද එක වරක් මරණයත්, ඉන්පසු විනිශ්චයත් මිනිසාට නියම ව ඇති සේ ම, බොහෝ දෙනෙකුගේ පව් දුරු කරන පිණිස එක ම වරක් ක්‍රිස්තුන් වහන්සේ දිවි පිදූ සේක. තවද, පාපය දුරු කරන පිණිස නොව, උන් වහන්සේගේ ආගමනය බලා සිටින්නන්ට ගැළවීම දෙන පිණිස, උන් වහන්සේ දෙ වන වර ප්‍රකාශ වන සේක. එබැවින් සහෝදරවරුනි, උන් වහන්සේගේ දිවි පිදීම හේතුකොටගෙන ශුද්ධස්ථානයට ඇතුළු වීමට අපට නිදහස තිබේ. උන් වහන්සේ ස්වකීය ශරීරය නමැති තිරය මැදින් අප උදෙසා අලුත් ජීවමාන මාර්ගයක් විවෘත කර දුන් සේක. තවද දෙවියන් වහන්සේගේ ගෘහවාසීන් කෙරෙහි උතුම් පූජකයෙක් ද අපට සිටියි. එබැවින් අපි නපුරු හෘදය සාක්ෂියකින් පවිත්‍ර කරනු ලැබූ සිත් ද, පිරිසිදු වතුරෙන් ධෝවනය කළ ශරීර ද ඇති ව අවංක සිතක් හා ඒකාන්ත ඇදහීමේ සහතිකය ද ඇති ව, දෙවියන් වහන්සේ වෙත ළඟා වෙමු. පොරොන්දුව දුන් තැනැන් වහන්සේ විශ්වාසවන්ත බැවින් අප පිළිගත් බලාපොරොත්තුවෙහි නොසෙල්වී, ස්ථිර ව පිහිටා සිටිමු.

දේව වචනය මෙසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## සුපුවත් ජය නද

ලූක් 24:32

ආලේලූයා! ආලේලූයා!
ඔබ ගොස්, සකල ජාතීන් ගෝලයන් කරන්න. මා ඔබට අණ කළ සියල්ල රක්ෂා කරන්න ඔවුන්ට උගන්වන්න. මම ද සදහට ම ඔබ හා සමග සිටිමි.
ආලේලූයා!

## ශුද්ධවූ සුවිශේෂය

ලූක් 24:46-53

ලූක් තුමගේ ශුද්ධවූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.

**උන් වහන්සේ ඔවුන්ට ආශීර්වාද කරත් ම ස්වර්ගයට ඔසවනු ලැබූ හ.**

"මෙසේ ක්‍රිස්තුන් වහන්සේ වද විඳින්ටත් තුන් වන දා මළවුන්ගෙන් නැඟිටින්ටත්, ජෙරුසලමෙන් පටන්ගෙන සකල ලෝකවාසීන්ට මනස්ස්ථාපනය ද පව් කමාව ද, උන් වහන්සේගේ නාමයෙන් ප්‍රකාශ කරනු ලබන්නට ද යුතු ම යයි ලියා ඇත. ඔබ මේ දේවලට සාක්ෂිකාරයෝ වන්නහු ය. බලන්න, මම මාගේ පියාණන් වහන්සේගේ පොරොන්දුව ඔබ වෙත ගෙනෙමි. එහෙත්, ඉහළින් වන බලපරාක්‍රමයෙන් ඔබ හැම සන්නද්ධ කරනු ලබන තුරු නගරයෙහි නැවතී සිටින්නැ"යි වදාළ සේක. උන් වහන්සේ බෙතානිය දක්වා, ඔවුන් කැඳවාගෙන ගොස්, තමන්ගේ අත් ඔසවා ඔවුන්ට ආශීර්වාද කළ සේක. එසේ ආශීර්වාද කරද්දී ම, උන් වහන්සේ ඔවුන් කෙරෙන් වෙන් ව, ස්වර්ගයට ඔසවාගනු ලැබූ සේක. ඔව්හු උන් වහන්සේට නමස්කාර කොට, ඉමහත් ප්‍රීතියකින් ජෙරුසලමට හැරී අවුත්, නිරතුරු දේව මාලිගාවෙහි දෙවියන් වහන්සේට ප්‍රශංසා කරමින් කල් ගත කළහ.

සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය. ක්‍රිස්තුනි ඔබ වහන්සේට ප්‍රශංසා වේවා.

ලබන ඉරුදින දේව ප්‍රකාශන සඳහා http://sinhalagospel.lk/ වෙත පිවිසෙන්න.